# ප්‍රතිමාන

2017/2018
11 වන වෙළුම

**Prathimana : Journal of The Department of Sociology**
**Eleventh Volume**

රුහුණ විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා
අධ්‍යයනාංශයේ වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය

# ලාංකේය සිවිල් සමාජය හා ජන සංස්කෘතියේ ගමන් මග

මොහමඩ් මහීස්

## හැඳින්වීම

වත්මන් ලාංකේය සිවිල් සමාජය (Civil Society) හා ජන සංස්කෘතිය (Mass Culture) පිළිබඳ කථිකාව වර්තමානයේ දී සාකච්ඡාවට ලක්කළ යුතු බව සමකාලීන සමාජ සන්දර්භයේ විවිධ පැතිකඩ සියුම්ව විමර්ශනයේ දී හඳුනා ගත හැකි තත්ත්වයකි. සිවිල් සමාජය, සමාජයේ හරස්කඩයක් ගෙන ජන සංස්කෘතිය පිළිබඳ ප්‍රායෝගික තත්ත්වයන් විමර්ශනය කිරීමේ දී වත්මන් සමාජ සන්දර්භයේ සිවිල් සමාජය පවතින්නා වූ ස්ථානයත්, ජන සමාජය පවතින්නාවූ ස්ථානයන් හඳුනා ගනිමින් සමාජ ප්‍රගමනය කරා යෑම විමර්ශනය කිරීම මෙම ලිපියේ අපේක්ෂාව වේ. අද වන විට පශ්චාත් නූතනවාදීන්ගේ අදහස්වලට අනුව සමාජය නොයෙක් වෙනස්වීම්වලට භාජන වෙමින් පවතී. පශ්චාත් කාර්මික සමාජය, පරිභෝජනවාදී සමාජය, පශ්චාත් නූතන සමාජ වෙතින් අවදානම් සමාජ දක්වා වර්ධනය වෙමින් පවතී. මෙවන් ගෝලීය සමාජවලට සාපේක්ෂව ලාංකේය ජන සමාජයේ ද පරිවර්තනය අනිවාර්ය වූවකි. මේ අනුව වත්මන් සමාජ සංස්කෘතිය යන්න හඳුනා ගනිමින් වර්තමාන ලාංකේය සිවිල් සමාජය හා ජන සංස්කෘතියෙහි සම්බන්ධතාව පැහැදිලි කිරීම මෙහිදී සිදු කිරීම අපේක්ෂිත ය. මේ සඳහා ලාංකේය සමාජය නිදහසට පෙර සිට වර්තමානය දක්වා විවිධ සංස්කෘතික ගතිකයන් හමුවේ පරිවර්තනය වීමේ ප්‍රවණතාව මෙහි දී සාකච්ඡා කරනු ලැබේ.

## සමාජය හා සංස්කෘතිය

යම් සමාජයක සමස්ත පැවැත්ම නිරන්තරයෙන් ම නිර්ණය කරනු ලබන්නේ එම සමාජයේ සංස්කෘතිය මගින් ය. සංස්කෘතිය යනු හුදෙක්ම පාරම්පරිකත්වය, කලාව හා වෙනත් විනෝද ආස්වාදජනක දේවල් පමණක්ම නොවේ. යම් සමාජයක පැවැත්ම සඳහා අවශ්‍ය භාෂාව, සංකේත, අන්තර් සම්බන්ධතාව, අගයන්, ධර්මතාවන්, නීතිරීති, තහංචි, ජීවන කුසලතාවන් හා ජීවන රටාවන්ගෙන් සමන්විත සමස්තය සංස්කෘතිය වේ. එම සංස්කෘතිය මිනිසා විසින් ඉගෙන ගනු ලබන අතර

එය එක් එක් පුද්ගලයින් තමන්ට සුවිශේෂී වූ ලෙස තමන් සතු කර ගැනීමේ ක්‍රියාවලිය හරහා තමන්ගේ පෞරුෂය ද වර්ධනය කර ගැනීමට ඉවහල් කොට ගනී (Giddens, 1997). එයින් අදහස් වන්නේ සංස්කෘතිය හා පුද්ගල පෞරුෂය අතර ඉතා සමීප සම්බන්ධතාවක් ඇති බව ය. අප විසින් සමාජය යනුවෙන් හඳුන්වනු ලබන්නේ හුදෙක් පුද්ගලයන්ගේ එකතුවක් ඉක්මවා ගිය සංකල්පයක් පිළිබඳව යි. සමාජයක ජීවනාලිය වන්නේ ද සංස්කෘතිය යි. සමාජයක පුද්ගලයින්ගේ සාමූහිකත්වය පවත්වාගෙන යනු ලබන්නේ එකී සමාජයේ සාමූහික විඥානය වන සංස්කෘතිය මඟින් ය. ඕනෑම සමාජයක පැවැත්ම රඳා පවතින්නේ එම සමාජයේ චාලක බලය වන සංස්කෘතිය මත යි. සංස්කෘතියෙන් පරිබාහිරව සමාජයක් පැවතිය නොහැකි වන අතර මිනිස් සමාජය සත්ව සමාජයෙන් වෙන් කොට දක්වන ප්‍රධානත ම සාධකය වන්නේ ද සංස්කෘතිය යි.

සංස්කෘතිය හා සොබා දහම අතර නිරන්තර අන්තර් සම්බන්ධතාවක් පවතියි. ඕනෑම සමාජයක සංස්කෘතිය කෙරෙහි එම සමාජයේ පවතින භෞතික පරිසරය, දැඩි ලෙස බලපෑම් සිදු කරයි. එමෙන්ම සංස්කෘතිය විසින් ද භෞතික පරිසරයට බලපෑම් කරනු ලබයි. මෙය එක්තරා ආකාරයක සොබා දහම හා සංස්කෘතිය අතර පවතින ද්වන්ද්ව සටනක් බඳු ය. අතීතයේ වැඩි වශයෙන් සොබා දහම මගින් සංස්කෘතියට බලපෑම් කරනු ලැබුව ද වර්තමානයේ සංස්කෘතිය විසින් සොබා දහම පාලනය කරමින් සිටිනු හඳුනා ගත හැකි ය (Beck, 1992).

අප ජීවත්වන සමාජය තුළ නිරන්තරයෙන් අසන්නට ලැබෙන ප්‍රකාශයක් වන්නේ "සංස්කෘතිය විනාශ වන බව යි". එහෙත් කිසිදු සමාජයක සංස්කෘතියක් විනාශ නොවේ. සංස්කෘතිය තුළ 'හොඳ' හෝ 'නරක' ලෙස බෙදා වෙන් කළ නොහැකිවාක් මෙන් ම සංස්කෘතිය විනාශ වන බවට වූ ප්‍රකාශය ද සාවද්‍ය වූවකි. සංස්කෘතිය ගතික ය. එය නිරන්තර වෙනස්වීම්වලට භාජන වේ. එසේ නොවූ විට එයට අනුගත සාමාජිකයන්ට දැඩි අර්බුදවලට හා අභියෝගවලට මුහුණදීමට සිදු වේ. ඕනෑම සමාජයක දියුණුව හෝ සංවර්ධනය අදාළ සංස්කෘතියේ පරිවර්තන හැකියාව හෝ ධාරිතාව මත රඳා පවතින්නේ ය. එකී සමාජයක ජීවත්වන පුද්ගලයන්ගේ අලුත් ජීවන අවශ්‍යතා හා සමාජ ප්‍රශ්න එකී ජීවත්වන සමාජයේ සංස්කෘතිය මගින් විසඳිය යුතු ය. නැතහොත් විසඳා ගැනීමට තරම් සංස්කෘතිය නම්‍යශීලී විය යුතු ය. එසේ සිදු නොවන විට එම සමාජයේ නොයෙක් පුද්ගල හා සමාජ ප්‍රශ්න (සියදිවි නසා ගැනීම, ගබ්සා කිරීම, ළමා අපචාර, පරිසර දූෂණය, අපරාධ) ඇති වේ. ඕනෑම

සංස්කෘතියක් ඊට අනුගත පුද්ගලයන්ට හෝ සමාජයට තම වෙනස් වන ප්‍රශ්න හෝ අභියෝග විසඳා ගැනීමට අවශ්‍ය තරම් අවකාශයක් හෝ ඉඩ ප්‍රස්ථාවක් ලබා දිය යුතු ය. එසේ නොමැති විට එම පුද්ගලයන් හෝ සමාජය තමන්ට අවශ්‍ය පරිදි තම සංස්කෘතික සීමාවෙන් ඔබ්බට ගොස් තම ප්‍රශ්න විසඳා ගැනීමට හෝ අවශ්‍යතා සපුරා ගැනීමට දරන උත්සාහය "සංස්කෘතික විනාශය" යනුවෙන් සාමාන්‍ය ජනතාව විසින් හඳුන්වනු ලබයි.

සමාජයට මෙතරම් වැදගත් සංස්කෘතිය උත්පාදනය වන්නේ කෙසේද හා කුමන ආකාරයෙන්ද යන්න තීරණාත්මක වේ. යම් සමාජයක පවතින සොබා දහම, ආගම, ඉතිහාසය, මිත්‍යාවන්, මුතුන් මිත්තන්ගෙන් පැවත එන විශ්වාස, චාරිත්‍ර, පාරම්පරිකත්වය, කලා කටයුතු හැකියාවන් මගින් යම් සංස්කෘතියක් ස්වභාවිකව ආරම්භ වී ස්වභාවික ක්‍රියාවලියක් මගින් වෙනස්වීම්වලට ලක් වන්නේ නම් එය 'සිවිල් සංස්කෘතිය' ලෙස හැඳින්විය හැකි ය. එමෙන්ම යම් සමාජයක පවතින මාධ්‍ය, දේශපාලනය හෝ ව්‍යාපාරික ආයතන මගින් එම සමාජයට බලපෑම් සිදුවන ආකාරයේ නව සංස්කෘතියක් හෝ සංස්කෘතික වෙනස්කම් සකස් කොට ඒවා එම සාමාජිකයන් අතරට මුදාහරිනු ලැබීම මගින් ඇති කරනු ලබන කෘත්‍රිම හෝ කර්මාන්තයක් ලෙස ඇති කරන සංස්කෘතිය 'ජන සංස්කෘතිය' ලෙස හැඳින්විය හැකි ය (Miles, 2001). මෙම "ජන සංස්කෘතිය" විසින් සිවිල් සංස්කෘතියට දැඩි බලපෑම් සිදු කරනු ලබන අතර එමගින් ලාංකේය සමාජය විවිධාකාරයේ පරිවර්තන, අභියෝග සහ ගැටලුවලට මුහුණදෙමින් පවතී. නූතනත්වය යටතේ ධනවාදය හෝ ජනමාධ්‍ය විසින් සංස්කෘතිය ප්‍රතිනිර්මාණය කරනු ලැබෙයි. එවැනි තත්ත්වයක් සංස්කෘතික කර්මාන්ත (Cultural Industries) යනුවෙන් හැඳින්වේ. අද වන විට ලාංකේය මාධ්‍ය කලාව පරිභෝජන හා දේශපාලන සංස්කෘතිය හේතුවෙන් මුළුමනින් ම පාහේ නව ජන සංස්කෘතිය නිර්මාණය කොට තිබේ.

### පූර්ව හා පශ්චාත් නිදහස් සමාජය (1930-1980)

නිදහසට පෙර ලාංකේය සමාජය ප්‍රාග් නූතන තත්ත්වයේ පැවැති අතර එම වකවානුවෙහි දී ලාංකේය සමාජ ව්‍යුහය ඥාතිත්වය, ඉඩම් පරිභෝජනය හා කුලය යන සමාජ ආර්ථික සාධක මත රඳා පැවතිණ. බුදු දහම හා ප්‍රභූ පංතියෙන් සමන්විත පාරම්පරික ආධිපත්‍ය එකී සමාජය පාලනය කරන ප්‍රධාන සාධක බවට පත්විය. මෙම සමාජයේ චූල සම්ප්‍රදායට අයත් සාමාන්‍ය පොදු මහජනතාව මහ

සම්ප්‍රදාය හා සමාජ ආර්ථික තත්ත්වය නම් ප්‍රභූ පංතිය විසින් පාලනය කරන ලද අතර එහි ප්‍රතිඵලය ලෙස සාමාන්‍ය ගැමි සමාජයේ සංස්කෘතිය හා ජීවන රටාව ඉතා සුළු වශයෙන් සමාජ පරිවර්තනයට ලක් විය. මෙය එක්තරා ආකාරයකට සමාජ විෂමතාවන්ගෙන් අධික එක්තරා වරප්‍රසාද හිමි පංතියක් හෝ කුලයක් පමණක් සමාජයේ ඉහළ තත්ත්වයකට පත් විය. මෙම වකවානුව තුළ අධිරාජ්‍ය හා ක්‍රිස්තියානි විරෝධී සමාජ ව්‍යාපාර හා බෞද්ධ ව්‍යාපාර ඉතා ප්‍රබලාකාරයෙන් මතු විය(Roberts,1973). යටත්විජිත යුගය තුළ අධිරාජ්‍යවාදීන් විසින් හඳුන්වාදුන් ආර්ථිකය සමඟ එවක පැවති සමාජ හා පංති ක්‍රමය වෙනස් වූ අතර එමගින් අලුත් ප්‍රභූ පන්තියක් බිහිවෙමින් ලාංකේය සමාජ ව්‍යුහය පරිවර්තනයට ලක් කෙරිණි (Jayawardana, 2003).

නිදහසින් පසු (1948-1960) ලාංකේය සමාජයේ ගමන් මග තරමක් වෙනස් විය. මෙම වකවානුව තුළ වැඩි වශයෙන් ලිබරල් ආර්ථික ප්‍රතිපත්තියක් හා නිදහස් අධ්‍යාපනය හා සෞඛ්‍ය ප්‍රතිපත්තියක් මෙන් ම යම් අවස්ථාවල ආවෘත ආර්ථික ප්‍රතිපත්තියක් හඳුන්වාදීම මගින් සිවිල් සමාජය තුළ නව පිබිදීමක් ඇති විය. විශේෂයෙන් ම සර්වජන ඡන්ද බලය හා නිදහස් අධ්‍යාපනය සමාජයේ දැවැන්ත පරිවර්තනයක් සිදු කිරීමෙහි සමත් විය. එහෙත් එය දේශපාලන වශයෙන් යම් යම් සමාජ කොටස්වලට පමණක් සීමා වූවක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස නිදහස් අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවාව පශ්චාත් යටත්විජිත ලාංකේය සමාජය නව පරිවර්තනයක් කරා ගෙන ගියේය. විශේෂයෙන්ම 1950 හා 1960 දශක දෙක මෙරට ඉතිහාසයේ ඉතා වැදගත් හා තීරණාත්මක සිවිල් සමාජයක් නිර්මාණය කිරීමෙහි සමත් විය. නිදහස් අධ්‍යාපනය හා සමාජවාදී රාජ්‍ය ප්‍රතිපත්ති මුල් කොටගෙන මෙම යුගයේ ලිබරල් හා නව ශාස්ත්‍රීය සමාජයක් බිහි විය. ඒ යුගයේ බිහි වූ විද්වතුන් හා ඔවුන්ගේ ශාස්ත්‍රීය කටයුතු, දේශපාලන මතවාද හා කලාව වර්තමානයේ පවා අභියෝගයට ලක් කළ නොහැකි තරම් ඉහළ මට්ටමක පවතින අතර ඒ යුගය ඉතා සුවිශේෂ මතවාදයන්ගෙන් පොහොසත් සමාජ වාතාවරණයක් ඇති කිරීමෙහි සමත් විය. මෙරට සමාජයේ ශාස්ත්‍රීය හා විචාරශීලී බව වර්ධනයෙහි ලා අතිශය වැදගත් වූ අතර ලාංකේය සමාජයට අවශ්‍ය බුද්ධිය, කලාව හා දේශපාලන මතවාදවල සම්භාවනීය පසුබිම ඉතා ශක්තිමත්ව සකස් කරනු ලැබී ය.

පින්නවල (2004) පවසන පරිදි නිදහසින් පසු මෙම දශක දෙක තුළ සිටි රාජ්‍ය නායකයන් බහු ජනවාර්ගික අනන්‍යතාවන්ගෙන් යුක්ත බුද්ධිමත් ප්‍රභූ පිරිසක් වූ

බැවින් සමාජයෙහි යම් ආකාරයක ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයක් ක්‍රියාත්මක වනු දක්නට ලැබිණි. මෙම යුගය තුළ යටත් විජිත ප්‍රභූ පංතියේ බලපෑම් දක්නට ලැබුණ ද ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් බිහි කිරීමෙහි ලා කැපවීමෙන් කටයුතු කළ ද එම තත්ත්වය 1960 අවසානයේ දී පමණ බිඳවැටෙන්නට විය. මෙම දශක දෙක ඇතුළත හඳුන්වා දෙන ලද සමාජවාදී සමාජ හා රාජ්‍ය පාලන, ආර්ථික ප්‍රතිපත්තිය හා නිදහස් අධ්‍යාපනය මගින් තත්කාලීන හා පශ්චාත්කාලීන ලාංකේය සමාජය තුළ නව සමාජ සංවර්ධනයක් ඇති කිරීමෙහි සමත් විය. එය දකුණු ආසියාවේ අන් කවර රටකවත් නොමැති ආකාරයේ සුවිශේෂ සමාජ තත්ත්වයක් ලාංකේය සමාජය තුළ ඇති කළේය. නිදහස් අධ්‍යාපනයෙහි ප්‍රතිඵල ලෙස බිහි වූ මධ්‍ය මහා විද්‍යාල, ස්වභාෂා අධ්‍යාපනය, විශ්වවිද්‍යාල අධ්‍යාපනය හා නව ආකාරයේ දේශපාලන මතවාද ලාංකේය සමාජය ඉතා ස්ථාවර මට්ටමක ඔසවා තැබුවේය (උස්වත්ත ආරච්චි, 2007).


1970 මෙරට සිවිල් සමාජය ක්‍රමයෙන් වෙනස් වන්නට විය. විශේෂයෙන් ම 1970 හා 1980 දශකවල පක්ෂ දේශපාලනය උත්සන්න වූ අතර ලාංකේය සමාජය ප්‍රචණ්ඩකාරී සිවිල් සමාජයක් වෙත තල්ලු කරනු ලැබීය (පින්නවල, 2004). මෙම යුගය දකුණේ මෙන්ම උතුරේ ද ප්‍රචණ්ඩත්වය හා සිවිල් යුදමය තත්ත්වයක් ඇති කිරීමෙහි සමත් විය. ආර්ථික අර්බුද, තරුණ අසහනය, දේශපාලන මර්දනය හා සමාජ අසමානතාව ආදිය මෙම තත්ත්වය නිර්මාණයෙහි ලා හේතු විය. මෙම වකවානුවෙහි තරුණ ප්‍රචණ්ඩත්වය හා සිවිල් සමාජයේ දැඩි මර්දනයට ලක්වීම හේතුවෙන් සමාජය තුළ සන්නද්ධ සංස්කෘතියක් බිහි විය (අයිවන්, 2006). එය සමාජයේ සෑම අංශයකට ම බලපෑම් කරන ලදී. උතුරු නැගෙනහිර ඇති වූ යුද්ධය මෑත කාලය දක්වාම සිවිල් සමාජය තුළ නොයෙක් අර්බුද හා පරිවර්තන ඇති කළ අතර එමගින් ජනවාර්ගික සංහිඳියාවට ද බලපෑම් විය. ලාංකේය සමාජ ඉතිහාසයේ නොමැකෙන සටහනක් වූ ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය සිවිල් සමාජයේ ඇති වූ අර්බුදයකට වඩා දේශපාලන අර්බුදයක් යැයි සමාජ විද්‍යාත්මක ලෙස විචාරශීලීව අදහස් දැක්විය හැකි ය. මක් නිසාදයත් ලාංකේය සිවිල් සමාජයේ සාමාජිකයින් අතර හෝ සිවිල් ජන කොටස් අතර ජනවාර්ගික වශයෙන් ගැටුම් ඇති නොවූ අතර ජනවාර්ගික අර්බුදය බෙහෙවින් දේශපාලන කාරණාවක් ලෙස දේශපාලනඥයින් විසින් හුවා දැක්වීමක් පමණක් වීම හේතුවෙනි. මෙවන් ආකාරයෙන් දේශපාලනීකරණය වූ ජනවාර්ගික අර්බුදයට සියලු ජන වර්ගවල අන්තගාමී මතවාදවලින් යුතු කණ්ඩායම් ක්‍රියාකාරී විසින් වඩා බලපෑම් කරනු ලැබී ය.

## ජනවාර්ගික අර්බුදය හා සිවිල් සමාජය

1990 හා 2000 දශකවල ලාංකේය සිවිල් සමාජය සාම ක්‍රියාදාම මෙන් ම යුදමය වාතාවරණයක් යන දෙකම බලපෑම් කළේය. විටින් විට දේශපාලන හෝ රාජ්‍ය ක්‍රියාදාමයේ ජනවාර්ගික අර්බුදය විසඳීමේ මතවාදය අනුව ඒ ඒ අවස්ථාවන්වල පැවැති රජයන් යුද්ධය මෙන් ම සාම සාකච්ඡා තෝරා ගැනීම හේතු කොට ගෙන සිවිල් සමාජය කැමැත්ත අකමැත්ත නොතකා එවකට දේශපාලන නායකත්වය තමන්ට අවශ්‍ය පරිදි සිවිල් සමාජයෙහි ජනවාර්ගික මතවාදය සකස් කිරීමෙහි උත්සුක විය. මෙම තත්ත්වය යහපත් මෙන් ම අයහපත් ලෙස ද බලපෑවේය. දේශපාලන වශයෙන් න්‍යායගත වූ ජනවාර්ගික ගැටලුව හා ඒ සඳහා දේශපාලන නායකත්වයක් ලබා දුන් විසඳුම් මගින් සිවිල් සමාජය ප්‍රබල ලෙස වෙනස් වෙන්නට විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස තම සුළු ජාතික දේශපාලන පක්ෂ, ආගමික ව්‍යාපාර, දේශප්‍රේමී ජාතික ව්‍යාපාර හා නොයෙක් රාජ්‍ය නොවන සංවිධාන ද බිහි විය. එමෙන්ම යුද්ධ හා ත්‍රස්තවාදය හේතු කොටගෙන ඇති වූ ආරක්ෂක විධික්‍රම, නීතිරීති හා සන්නද්ධ ක්‍රියාදාමය හේතුවෙන් යුද්ධය පැවැති ප්‍රදේශවල සිවිල් සමාජය මුළුමනින්ම ප්‍රතිසංවිධානය වූ අතර අනෙකුත් ප්‍රදේශවලට ද එය දැඩි බලපෑම් කළේය. දේශප්‍රේමී බව, ජාතිවාදී බව, විදේශ කුමන්ත්‍රණ, රාජ්‍ය නොවන සංවිධාන, සංක්‍රමණය, අනාථ කඳවුරු, මායිම් ගම්මාන, යුද ආර්ථිකය, ළමා සෙබලුන්, රණවිරු සුභසාධනය, ඩයස්පෝරාව හා සංහිඳියාව යනා දී නොයෙක් සංකල්ප සමාජය තුළට සම්ප්‍රේෂණය විය. එමෙන්ම සිවිල් සමාජය හා කලාව මගින් ද මේ තත්ත්වයන්ට උචිත පරිදි ප්‍රතික්‍රියා දැක්වීය. ඒ හේතුවෙන් යුද්ධය හා සාමය පිළිබඳ නොයෙක් චිත්‍රපට, නාට්‍ය, ගීත, නවකථා, චිත්‍ර යනාදී කලා නිර්මාණ බිහි විය. යම් අවස්ථාවන්වල මෙම කලා හෝ සාහිත්‍ය නිර්මාණ, දේශපාලන නායකත්වයට ද බලපෑම් එල්ල කළේය. වරින් වර ඇති වූ යුදමය හෝ සාම ක්‍රියාදාම හේතුවෙන් ජන සංක්‍රමණ දේශීය වශයෙන් ජනවාර්ගික පදනමක් මත පදිංචි ප්‍රදේශ සකසා ගැනීම, ජීවිකා වෘත්ති වෙනස්වීම, නව අධ්‍යාපන ආයතන හා පාඨමාලා බිහිවීම, සිවිල් ආරක්ෂක සමාජ, ආර්ථික තත්ත්වයන්ට ද බලපෑම් කළේය. මේ අවස්ථාවල පැවති යුදමය තත්ත්වය කරන කොට ගෙන ධනාත්මක ලෙස සමාජ, ආර්ථික හා අධ්‍යාපන ප්‍රතිලාභ ලබා ගත් ජන කොටස් ද මේ අතර විය. උදාහරණයක් ලෙස විදේශ සංක්‍රමණ අවස්ථාවන් ඉහළ යෑම, සංක්‍රමණිකව ලැබූ සුභසාධන, නව දේශපාලන අවස්ථා නව විශ්වවිද්‍යාල හා අධ්‍යාපන පීඨ බිහිවීම, මායිම් ගම්මානවලට නව දියුණු ආර්ථික ක්‍රම, කුලය, පංතිය, විවාහය යන සංස්කෘතික සාධකවල ඇති වූ සුබවාදී

වෙනස්කම් ආදිය මේවායින් සමහරක් වේ. දේශපාලන නායකත්වය හා දේශපාලන වශයෙන් සැකසුණු සංවිධාන හෝ කණ්ඩායම් සිවිල් සමාජය, යුදමය තත්ත්වය (War-footing) හා ජනවාර්ගික සංහිඳියාව (Ethnic Reconciliation) යන අන්තයන් දෙක අතරේ දෝලනය කරනු ලැබූ අතර ඒ මගින් සිවිල් සමාජය අසරණ තත්ත්වයකට පත් කරමින් සිටි ආකාරය හඳුනාගත හැකි ය. එම තත්ත්වය පහත රූප සටහන පරිදි ලඝු කළ හැකිය. දේශපාලන සමාජයට හෝ රාජ්‍යයට වඩා සිවිල් සමාජය ප්‍රබල විය. නමුත් යුද හෝ සාම තත්ත්වයක් යටතේ දේශපාලනය විසින් සිවිල් සමාජය ද කෘත්‍රිමව සකස් කොට හෝ දේශපාලන වාසි සහගත ආකාරයෙන් සැබෑ නොවන සිවිල් සමාජයක් සකස් කරමින් තිබේ.

රූප සටහන 01




## නූතනත්වය හා ලාංකේය සමාජය

සමකාලීන ශ්‍රී ලාංකේය සමාජය දෙස නූතනත්වය යන ප්‍රවේශයෙන් විමර්ශනය කිරීමේ දී එතුළින් බොහෝ දේ අවබෝධ කරගත හැකි වේ. නූතනත්වය සමාජය තුළ සිදුවන සංකීර්ණ ක්‍රියාවලියක් මගින් සිදුවේ. Doshi (2006) පවසන පරිදි නූතනත්වය යනු සමාජයෙහි ජීවත්වන පුද්ගලයාගේ අදහස්, ආකල්පවල සිට සමස්ත සමාජයේ සියලු සමාජ, සංස්කෘතික හා සමාජ සංවිධාන තාර්කිකත්වය, යාන්ත්‍රීකරණය හා විවිධාංගීකරණයට ලක්වීම සිදුවේ. මෙමගින් සමාජයේ පවතින පවුල් ජීවිතය, අධ්‍යාපනය, ආගම, සාරධර්ම සියලු දේ භෞතිකවාදී හා යාන්ත්‍රික ක්‍රියාවලියකට

යටත් වේ. සමාජය තුළ සියලු කටයුතු පුද්ගලාර්ථකරණයට මෙන්ම තාර්කික, විද්‍යාත්මක හා තාක්ෂණික පදනමක් මත සිදු වේ. වර්තමාන ලාංකේය සමාජය තුළ ද මෙය හොඳින් නිරීක්ෂණය කළ හැකි වේ. වර්තමාන ලාංකේය සමාජයේ අධ්‍යාපනය, සෞඛ්‍යය හා සියලුම ආර්ථික කටයුතු (බැංකු) ශීඝ්‍ර යාන්ත්‍රික හා තාක්ෂණික ක්‍රියාවලියකට ලක්වී තිබේ. මෙමගින් සැබෑ දක්ෂතා මෙන්ම හා විචාර බුද්ධිය නූතන විද්‍යාවට හා තාක්ෂණයට යටත් කොට ඇත. සමාජය තුළ පුද්ගලයන්ගේ සැබෑ දක්ෂතාව හා බුද්ධිය ප්‍රගුණ කර ගන්නවා වෙනුවට තාක්ෂණය අනුකරණය කරමින් සිටී. නිදසුනක් ලෙස අද වන විට අධ්‍යාපන, සෞඛ්‍යය හා බැංකු පද්ධතියට යාන්ත්‍රික, තාක්ෂණික මෙවලම් නොමැතිව ක්‍රියාත්මක වීම ඉතා දුෂ්කරව පවතී. සමහර විට නූතනත්වයේ පදනම වූ තාක්ෂණ හා විද්‍යාව මානව සමාජයේ අවශ්‍යතාවන් සපුරාලීම වෙනුවට ඔවුන් තව තවත් අර්බුදයට ලක් කරමින් සිටී. වර්තමාන ලාංකේය සමාජය ගැටලු විසඳාගත නොහැකිව නූතනත්වයේ ගොදුරු බවට පත්ව ඇත. මෙම ගැටලුව අවබෝධ කර ගත් සැබෑ විචාරශීලී ජන කොටස් නූතනත්වයේ තාක්ෂණික උගුලට හසු නොවී කටයුතු කරමින් සිටීම ද දැකගත හැකි වේ. වර්තමාන සමාජයේ ප්‍රධාන ම අභියෝගය වන්නේ නූතනත්වය, තාර්කික හා විද්‍යාත්මක තාක්ෂණයේ දියුණුව සමඟ නොවිසඳෙන අධ්‍යාපන ගැටලු, සෞඛ්‍ය ගැටලු හා මූල්‍ය ගැටලු වැඩි වෙමින් පැවතීම ය. එම නිසා නූතනත්වය අපට හිමි කර දුන් හෝ හඳුන්වාදෙමින් සිටින නව ජීවන රටාව, නව සංස්කෘතිය හා තාක්ෂණය පිළිබඳව ඉතා විචාරශීලීව කටයුතු කළ යුතු වේ. මෙයට අදාළ බොහෝ ක්‍රියාදාමයන් නූතන සංස්කෘතික පරිවර්තනයක් හරහා සිදු වේ. අද වන විට අප හමුවේ ඇති නූතනත්වය ද බොහෝ අභියෝගවලට ලක්ව ඇත. Bauman හා Bordoniගේ (2014) අදහස්වලට අනුව වර්තමාන නූතනත්වය දැඩි අර්බුදයට ලක්ව ඇති අතර එය කනපිටට හැරී ඇත. මේ තත්ත්වය Bauman විසින් 'ද්‍රවශීල නූතනත්වය' යනුවෙන් (Liquid Modernity) හැඳින්වේ.

## සංස්කෘතික කර්මාන්තය හා මාධ්‍ය

ලාංකේය සමාජයේ සිදුවෙමින් පවතින සමාජමය හෝ සංස්කෘතිකමය පරිවර්තනය අවබෝධ කර ගැනීමට සමකාලීන සමාජ මෙන්ම සමාජ විද්‍යාත්මක න්‍යායන් බෙහෙවින් වැදගත් වේ. ඒවා අතරින් ජර්මනියේ ඇති වූ ෆ්‍රැන්ෆර්ට් ගුරුකුලයේ (Frankfurt School) විචාර න්‍යාය මෙම තත්ත්වය තේරුම් ගැනීමට වඩාත් සුදුසු වේ.

මෙම විචාර න්‍යාය මගින් පළමු ලෝක යුද්ධයෙන් පසුව බටහිර යුරෝපයේ සිදු වූ සමාජ පරිවර්තනය පිළිබඳව දැඩි විවේචනශීලීව සාකච්ඡා කළේය. එකී ගුරුකුලය මාක්ස්වාදී ප්‍රවේශයක් මගින් යම් අවස්ථාවන්වල මාක්ස්වාදය ද විවේචනය කරමින් එවකට බටහිර යුරෝපයේ (1930-1970) සිදු වූ පරිභෝජනවාදී ධනවාදය හැසිරවූ සංස්කෘතික කර්මාන්තය දැඩි ලෙස විවේචනය කළේය (Appelrouth and Edles, 2011).

තියොඩර් ආර්ඩොනෝ විසින් ඉදිරිපත් කරන ලද සංස්කෘතික කර්මාන්තය යන සංකල්පය ද වර්තමාන ලාංකේය සමාජය අවබෝධ කර ගැනීමට ඉතා වැදගත් ය. සමකාලීන ජනප්‍රිය කලාවක් සේ ජනතාව අතරින් එක්වරම මතුවන සංස්කෘතියක් හැඳින්වීම සඳහා මෙම සංස්කෘතික කර්මාන්තය යන වචනය ඔවුන් විසින් යොදා ගන්නා ලදී. පැරණි සහ හුරුපුරුදු දේවල් සංස්කෘතික කර්මාන්ත විසින් නව ආරකට ගෙනයනු ලැබේ. ඒ අනුව ජනතාවගේ ප්‍රයෝජනය සඳහා භාවිත කිරීමේ ස්වභාවය අනුව ප්‍රතිසකස්කර සාදනු ලබන සියලුම දේ නිපදවනු ලබන්නේ මුළුමනින්ම පාහේ යම් සැලසුමක් අනුව ය. එනම් තනි තනි අංශ අතර හිඩැසක් ඇති නොවන පරිදි එකිනෙකට සම්බන්ධ වී ඇති මෙය කළ හැකි වන්නේ සමකාලීන තාක්ෂණ හැකියා මෙන්ම ආර්ථික හා පරිපාලන සමෝධානයෙනි. ඒ අනුව මෙම සංස්කෘතික කර්මාන්තය යටතේ අවුරුදු දහස් ගණනක් මුළුල්ලේ වෙන් කර තිබූ උසස් සහ පහත් කලාව බලහත්කාරයෙන් මෙන් එකතු කරන නමුත් එසේ කිරීම මෙම කලාවන් දෙකටම අහිතකර වේ (Swingewood, 1998).

සංස්කෘතික කර්මාන්තය තුළින් ඇති කරනු ලබන ජනප්‍රිය සංස්කෘතිය (Popular Culture) ජනතාවගේ කලාත්මක රසාස්වාදයට පමණක් නොව ඔවුන්ගේ දෛනික ජීවිතයේ සියලු කටයුතුවලට බලපෑම් කරමින් සිටියි. වර්තමානයේ සංවර්ධනයේ සංකේතයක් ලෙස මෝල් සාප්පු සංකීර්ණ (Super market Culture) ලාංකික සමාජය තුළ බිහිවීම පිළිබඳ දක්වන අදහසක් වන්නේ ආශා උපදවනු ලබන පරිභෝජන භාණ්ඩවලින් පිරී ගිය ආවරණය කරන ලද සිහින ලෝකයක් ලෙස ය. ඒ අනුව මෙම වෙළඳ සංකීර්ණය තුළ සුවඳ විලවුන්, ගෘහභාණ්ඩ, කාන්තා ඇඳුම් ආදිය සඳහා වෙන් වූ සුවිශාල අංශ පවතී. ඒ තුළ පාරිභෝගිකයාට යම් සුවිශේෂ දෙයක් සොයා යාමට තිබූ බැඳීම ඉවත් කර පාරිභෝගිකයා භාණ්ඩ විශාල ප්‍රමාණයක් තුළ අතරමං කරනු ලබයි. ඒ හරහා පාරිභෝගිකයන් බලෙන් පරිභෝජනයට නම්මවා ගන්නා අතරම ක්ෂණික පරිභෝජනයට යොමු කරවා ගැනීමක් ද කෙරේ. ලංකාවේ

මෝල් සංකීර්ණයක් යනු හුදෙක් ජනතාව භාණ්ඩ මිලදී ගැනීම සඳහා පමණක් භාවිත කරන ස්ථානයක් නොවේ. එය ඊටම ආවේණික ගතිකත්වයන්ගෙන් යුක්ත සමාජ සංවිධානයක් වන අතර ඒවා කොළඹ සහ ඒ අවට නාගරික ප්‍රදේශවලට පමණක් සීමා වී පවතී (පෙරේරා, 2003). ඒ අනුව ලාංකික සන්දර්භය තුළ මෝල් සංකීර්ණ වෙත යාම හෝ ඒ තුළ දී අන් අයට තමන්ව පෙනීමට අවකාශ සැලසීම සමාජීය සහ සංස්කෘතික වශයෙන් වැදගත් වන බැවිනි. එසේම මෙම වෙළඳ අවකාශ නාගරික, මධ්‍යම සහ උසස් පන්තික තරුණ තරුණියන්ගේ විලාසිතා රුචිකත්ව විදහාපාන ස්ථානයක් බවට ද පත්වී ඇති අතර ජන සන්නිවේදනයේ ගෝලීයකරණය තුළින් මේ විලාසිතා සහ ප්‍රවණතා ජනප්‍රිය වී ඇති බව පැහැදිලි වේ. එහෙත් මෙම සාප්පු සංකීර්ණ නගරයෙන් පිට ග්‍රාමීය ජනයා සංවර්ධනය පිළිබඳ සිහින ලොවක අතරමං කිරීමට ද සමත් විය හැකි ය. එසේම මෝල් සංකීර්ණ ලොව ඕනෑම ස්ථානයක දරිද්‍රතාව එතුළින් නෙරපා හරින ලද භෞතික, දේශගුණික හා සමාජීය වශයෙන් පාරිශුද්ධ කරන ලද පාලිත අවකාශයක් ලෙස ද සඳහන් කළ හැකි ය.

ක්‍රම ක්‍රමයෙන් සමාජයට ඇතුළත්වූ ජනප්‍රිය සංස්කෘතිය අද වන විට ලාංකේය සමාජයේ සෑම අංශයක්ම මුළුමනින් ම අත්පත් කරගෙන ඇත. අද වන විට සමාජය තුළ සිදුවන සියලු ක්‍රියාකාරකම් පාහේ විද්‍යුත් මාධ්‍ය මගින් පාලනය කරන තත්ත්වයට පත්ව ඇත. යම් පුද්ගලයෙක් පරිභෝජනය කළ යුතු ආහාර, පැළඳිය යුතු ඇඳුම්, සනීපාරක්ෂක කටයුතු, කලාකාමීත්වය, ආගමික දර්ශනය හා දේශපාලන මතවාද යන සියලු දේ සඳහා මාධ්‍ය බලපෑම් කරමින් සිටී. විශේෂයෙන් විද්‍යුත් මාධ්‍ය මගින් මානව සමාජයේ සියලු අංශවලට සුපිරි තරු (Super Star) බිහි කරමින් සිටියි. ජනප්‍රියම ගායකයා, ජනප්‍රියම නර්තන ශිල්පියා, ජනප්‍රියම බෞද්ධ භික්ෂුව හා ජනප්‍රියම දේශපාලකයා යන සියලු දෙනා සමාජගත කරනු ලබන්නේ විද්‍යුත් මාධ්‍ය මගින්ය. Habermas (2002) පවසන ආකාරයට ද අද වන විට ලොව පුරා විකෘති සන්නිවේදනය මගින් මුළු මිනිස් සමාජය අවුල් සහගත තත්ත්වයට පත් කොට ඇත. මාධ්‍ය මගින් කිසිසේත් වැදගත්කමක් නැති දේවල් හෝ පුද්ගලයන් ස්වකීය ඉත්තන් බවට පත් කරගෙන තිබේ. දවස පුරාම දරුවන්, කාන්තාවන්, වැඩිහිටියන් සහ සියලු කොට්ඨාස විද්‍යුත් මාධ්‍ය මගින් ජනප්‍රිය සංස්කෘතිය ඔස්සේ පරිභෝජනවාදී සමාජයක් කරා ගෙන යමින් තිබේ. එය එක්තරා ආකාරයකට මාධ්‍ය පාලනයක්

(Mediocracy) ලෙස මතුව ඇත. මේ අනුව ජන සමාජය මගින් සිවිල් සමාජය වසා සිටින බව හඳුනා ගත හැකි ය.

## පශ්චාත් නූතනවාදී සමාජය

වර්තමාන ලාංකේය සමාජය විශ්ලේෂණය කිරීම සඳහා යොදාගත හැකි තවත් වැදගත් පශ්චාත් නූතනවාදී චින්තකයෙක් වන්නේ ජීන් බෝඩ්රියාඩ්ය. Baudrillard ගේ (1993) අදහස්වලට අනුව වර්තමාන ලෝකයේ යථාර්ථය මියගොස් ඇති බව පැහැදිලි ය (End of Reality). ඒ වෙනුවට පවතින්නේ යථාර්ථය මෙන් පෙනී සිටින එහෙත් සත්‍ය නොවන යථාර්ථය යි. මෙසේ යථාර්ථය මෙන් කෘත්‍රිමව සකස් කරන ලද සත්‍යයට බෝඩ්රියාඩ් පවසන්නේ ආභාෂණය (Simulation) යනුවෙන් ය. බෝඩ්රියාර්ට අනුව මෙවන් ආකාරයෙන් කෘත්‍රිම යථාර්ථයක් මගින් සමාජය තුළ ඇති කරනු ලබන අලුත් සංස්කෘතික තත්ත්වය අධියථාර්ථය (Hyper-reality) නමින් හැඳින්වේ. අද වන විට ලාංකේය සමාජයේ සිදුවෙමින් පවතින බොහෝ දෛනික කටයුතු (ආහාර පරිභෝජනය, විලාසිතා අනුකරණය, මංගල උත්සව, ප්‍රවෘත්ති නිර්මාණය, ආගමික ක්‍රියාවලීන්, මහජන සුභසාධනය හා දේශපාලන කටයුතු) සැබෑ යථාර්ථය වෙනුවට හෝ කිසිසේත් සැබෑ යථාර්ථයට සමීප නොවන කෘත්‍රිම අධියථාර්ථය බවට පත්ව ඇත. අතීතයේ ජනතාව තම පරිභෝජනයේ දී හා වෙනත් දෛනික කටයුතුවල දී වැඩි වශයෙන් සැලකිලිමත් වූයේ යම් භාණ්ඩයක භාවිතමය වටිනාකම (Use Value) හා හුවමාරු හෝ ආර්ථික වටිනාකම යි (Exchange Value). එහෙත් අද වන විට ජනතාව තම පරිභෝජන ක්‍රියාවලිය තුළ වැඩි වශයෙන් සැලකිලිමත් හෝ ඔවුන්ව පරිභෝජනයට පොළඹවනු ලබන්නේ සංකේත වටිනාකම (Signvalue) මගින් ය. සමකාලීන ලාංකේය සමාජය තුළ ද ජනතාව භාණ්ඩ හා සේවා මිලදී ගැනීම වෙනුවට වැඩි වශයෙන් මිලදී ගනු ලබන්නේ සංකේත ය. වර්තමාන ලාංකේය සමාජයේ බහුතරයක් සාමාජිකයෝ මේ ආකාරයෙන් සංකේත පරිභෝජන (Symbolic Consumption) ක්‍රියාවලියේ තරගකාරී ලෙස නිරතවීම ඉතා අහිතකර තත්ත්වයක් බවට පත්ව ඇත. එමගින් ලාංකේය සමාජය පරිභෝජන සමාජයක් (Consumer Society) බවට පත්වෙමින් ඇත. සුපිරි වෙළඳසැල්වලින් ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම්, Mc Donald, KFC වැනි පිසූ ආහාර පරිභෝජනය, නවීන විලාසිතා සහිත ඇඳුම් පැළඳුම් මිලදී ගැනීම, මිල අධික වාහන භාවිතය,

සුඛෝපභෝගී නිවාස ඉදිකිරීම හා ගෘහ අලංකරණය, ඇන්ඩ්‍රොයිඩ් වර්ගයේ ජංගම දුරකථන, ටැබ් හෝ ලැප්ටොප් භාවිතය, රෝග ප්‍රතිකාර සඳහා ජනප්‍රිය සුඛෝපභෝගී පෞද්ගලික රෝහල් කරා යෑම, සංකේතවලින් පිරී ගිය අධියථාර්ථවාදී මංගල උත්සව යන සියලු ක්‍රියාවන් අපගේ සංකේත පරිභෝජන සමාජයට කදිම නිදසුන් වේ.

මෙවන් ආකාරයේ සංකේත පාදක වූ භාණ්ඩ හා සේවා පරිභෝජනය පුද්ගලයින්ගේ සැබෑ අවශ්‍යතා මත නොව ඔවුන්ගේ කෘත්‍රිම ආශාවන් තුළින් ඇති වන්නකි. මාධ්‍ය හා වෙළඳ ව්‍යාපාර ඇතුළත් සංස්කෘතික කර්මාන්තය මගින් සමාජයෙහි සැබෑ අවශ්‍යතාව (Real Needs) වෙනුවට කෘත්‍රිම ආශාවන් (Artificial Desires) හඳුන්වා දෙයි. එහෙයින් අද වන විට බොහෝ මිනිසුන් සංකේත මුල් කොට ගත් පරිභෝජනය පසුපස හඹායන බැවින් ඔවුන් ආර්ථික හා සමාජීය වශයෙන් අර්බුදකාරී තත්ත්වයකට මුහුණ දී ඇත. ඒ මගින් සාපේක්ෂ දරිද්‍රතාව, තරගකාරීත්වය, අතෘප්තිකර බව හා මානසික ආතතියෙන් පෙළෙන තත්ත්වයට පත්ව ඇත. ශ්‍රී ලංකාවේ සිදුවන බොහෝ පරිසර ප්‍රශ්නවලට ද මෙම සංකේත පරිභෝජනවාදය හේතු වී ඇත. තම සැබෑ අවශ්‍යතාව ඉක්මවා ගිය අනවශ්‍ය ආකාරයේ නිවාස ඉදිකිරීම්, ඒ ආශ්‍රිත පරිසර සම්පත් භාවිතය, සීමා ඉක්මවූ වාහන පරිභෝජනය, ආහාර අපද්‍රව්‍යවලින් 50% වැඩි වූ කැළිකසල බැහැර කිරීම්, සංකේත මුල් කොට ගත් පරිභෝජනයෙන් ඇති වන පරිසර ගැටලු කිහිපයකි. ලාංකේය සමාජය වර්තමානයේ පරිභෝජන සමාජයක් බවට පරිවර්තනය වී ඇති ආකාරය මෙයින් මනාව අවබෝධ කොට ගත හැකි ය.

**සමාජ මාධ්‍ය හා වර්තමාන පශ්චාත් නූතන සංස්කෘතිය**

පශ්චාත් නූතනවාදීන්ගේ අදහස්වලට අනුව වර්තමානයේ පවතින්නේ පශ්චාත් නූතනවාදී සමාජමය තත්ත්වයකි. ඒ අනුව අද වන විට බහු සංස්කෘතික, ගෝලීය මෙන්ම විද්‍යාව අබිබවා ගිය තොරතුරු තාක්ෂණය මගින් පවත්වාගෙන යන සමාජයකි (Ritzer,1996). වර්තමානයේ ලාංකේය සමාජය තුළ ක්‍රියාත්මක වන සමාජ මාධ්‍ය මෙයට කදිම නිදසුනක් වේ. සමාජයේ බොහෝ දෙනා ඉතා පහසුවෙන් ඔවුන් සතු ජංගම දුරකථන හෝ පරිගණක ආශ්‍රයෙන් නොයෙක් වර්ගයේ සමාජ මාධ්‍ය හා වියුටරි මාධ්‍ය ජාල භාවිත කරමින් සිටිති. මෙමගින් තොරතුරු හුවමාරුව ප්‍රජාතන්ත්‍රවාදීව හා නූතනවාදීව අදහස් දැක්වීමට අවස්ථාවක් තිබුණ ද, නූතන සමාජ

මාධ්‍ය (Facebook, Viber, Whatsapp, Imo) වර්තමාන ලාංකේය සමාජයට නොයෙක් ආකාරයේ අභියෝග එල්ල කරමින් සිටියි. අතීතයේ පුවත්පත් කිහිපයක් හා විද්‍යුත් මාධ්‍ය කිහිපයක් අප සතුව තිබූ අතර ඒවාහි කර්තෘවරුන් ද සීමිතය. එහෙත් අද වන විට ලාංකේය සමාජයේ සමාජ මාධ්‍ය භාවිත කරන සියලුදෙනා ම මෙන් පුවත්, කථිකා, ප්‍රශ්න නිර්මාණය කරන ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරුන් හා පුවත් කර්තෘවරුන් බවට පත්ව තිබේ. යම් පුද්ගලයෙකු සිතන ඕනෑම සිතුවිල්ලක් අදහසක් ක්ෂණිකව සමාජ මාධ්‍ය ඔස්සේ සමාජයට මුදා හරියි. එම සිතුවිල්ල හෝ පුද්ගලික අදහස රටේ ජාතික ආරක්ෂාවට, ජනවාර්ගික සමගියට, පුද්ගලයෙකුගේ චරිතයට හෝ මිනිසුන්ගේ චිත්ත ධෛර්යයට හානියක්, විනාශයක් වුවත් හුදෙක් පුද්ගල අභිමතය පරිදි සමාජ මාධ්‍ය ඔස්සේ සමාජයට මුදා හරිනු ලැබේ. මෙමගින් නොයෙක් ආකාරයේ පෞද්ගලික ප්‍රශ්න, ජනවාර්ගික අර්බුද, ආගමික වශයෙන් ඇති වන අසමගිය, දේශපාලන චරිත ඝාතන හා ස්ත්‍රීන්ට එරෙහි වූ ප්‍රචණ්ඩත්වයත් වැඩිවෙමින් පවතී. යම් පුද්ගලයෙක් සිහිනෙන් දුටු දේවල් පවා උදෑසන වන විට රට පුරා සමාජය තුළට මුදාහරින කිසිදු පාලනයක් හෝ ආචාරධර්ම නොමැති සමාජ මාධ්‍ය ක්‍රමයක් වර්තමාන ලාංකේය සමාජයේ සාමූහික විඥානයට හා ආගමික හා ජනවාර්ගික සංහිඳියාවට ද දැඩි ව්‍යසනයක් වී තිබේ. අද වන විට අපේ සමාජයේ බොහෝ දෙනා ආගම ධර්මය හෝ රටේ නීතියට වඩා CCTV කැමරාවට හා සමාජ මාධ්‍ය ජාලවලට බියෙන් තමන්ගේ සමහර ක්‍රියාවන් පාලනය කරමින් සිටිති. මේ අනුව පශ්චාත් නූතන ජන සමාජය විසින් සිවිල් සමාජය පාලනය කරනු මනාව හඳුනා ගත හැකි ය.

වර්තමාන ලාංකේය සමාජයේ සාමාන්‍ය රියදුරාගේ සිට විශ්වවිද්‍යාල ශිෂ්‍යයා දක්වා ම මුහුණු පොත ඇතුළු නොයෙක් සමාජ ජාලවලට ඇබ්බැහි වී ඇත. සමාජයට අවශ්‍ය බොහෝ දේ සමාජ මාධ්‍ය ජාල හරහා සිදු වුවත් කුඩා දරුවන් හා තරුණ තරුණියන්ගේ දවසේ වැඩි කාලයක් මෙවන් සමාජ මාධ්‍ය සමඟ ගත වන නිසා එම පුද්ගලයන්ට අවට සමාජ ලෝකය සමඟ අන්තර් ක්‍රියාවේ හෝ සමාජ සම්බන්ධතාවන්හි යෙදීමට ඇත්තේ ඉතා සුළු කාලයක් හා අවකාශයකි. එහෙයින් දරුවන්ගේ පෞරුෂ වර්ධනයට හා ඔවුන්ගේ බුද්ධි වර්ධනයට අනිවාර්යයෙන් අවශ්‍ය වන සැබෑ සමාජානුයෝජනය හා සොබා දහම සමඟ ඇති අන්තර් ක්‍රියාව ද බිඳවැටෙමින් පවතී. එමගින් අනාගත දරුවන් කෘත්‍රිම පෞරුෂ, දුබලතා ඇති එමෙන්ම සැබෑ බුද්ධියෙන් හීන වූ ප්‍රජාවක් බවට පත් වේ. අපට අවශ්‍ය වන්නේ හුදෙක් උගත් තාක්ෂණික දැනුම ඇති අනාගත පරපුරක් පමණක් නොව විචාර

බුද්ධියක්, සාමූහික විඥානයක් හා යහපත් විනයක් ඇති සමබර ජීවිතයක් සහිත අනාගත පරපුරකි. එම ඉලක්කය කරා යෑමට දැනට අප අතර ඇති සමාජ මාධ්‍ය ක්‍රමය බාධාවක් වී තිබේ. නූතන සමාජ මාධ්‍ය මගින් ගෝලීය පුරවැසිභාවය, පුද්ගල නිදහස, තොරතුරු දැන ගැනීමේ අයිතිය යනාදිය තහවුරු කරනු ලැබුවත්, නූතන ලාංකේය සමාජය Ulrich Beck සඳහන් කරන පරිදි අවදානම් සමාජයක් (Risk Society) බවට පත්වනවාදැයි සැකයක් මතුවෙමින් තිබේ.

## නිගමනය

මේ අනුව සමකාලීන ලාංකේය සිවිල් සමාජය හා ජන සංස්කෘතිය පිළිබඳ විචාරාත්මකව හඳුනා ගැනීමේ දී ජන සංස්කෘතිය මගින් සිවිල් සමාජය ආක්‍රමණය කර ඇති අතර පාලනය කිරීමක් ද සිදුවන අයුරු හඳුනාගත හැකි ය. ලාංකේය සිවිල් සමාජය හා ජන සංස්කෘතිය පිළිබඳ විචාරාත්මක සාකච්ඡාවේ දී සිවිල් සමාජය කරා ජන සමාජයේ බලපෑම් සහගත බව ලිපිය තුළ සාකච්ඡා විය. ලාංකේය සමාජයේ යටත්විජිත අවධියෙහි සිවිල් සමාජය හා ජන සංස්කෘතිය, පශ්චාත් යටත්විජිත අවධිය තුළ සිවිල් සමාජය, විවෘත ආර්ථිකයෙන් පසු අවධියේ සිවිල් සමාජය හා ජන සංස්කෘතියේ වෙනස්වීම, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවාවන් සමග වූ සිවිල් සමාජයේ වෙනස්වීම්, 1970 දශකයේ තරුණ කැරළි තුළින් වූ මතවාදීමය පෝෂණයෙන් යුතු සිවිල් සමාජයත් ආදිය ලිපිය තුළ සාකච්ඡා විය. මෙම සමාජ පසුබිම් තුළ සිවිල් සමාජයේ තත්ත්වය හා ජන සංස්කෘතියෙහි තත්ත්වය ඉතා සංකීර්ණ බව හඳුනා ගත හැකිය. ලාංකේය සමාජ සන්දර්භය විවරණයෙහි ලා විචාර න්‍යායේ එන Ardono, Habermas හා Baudrillard වැනි විචාරකයින්ගේ අදහස් සමග නූතනත්වය හා පශ්චාත් නූතනත්වය තුළ සිවිල් සමාජය පාලනය කරනු ලබන ජන සංස්කෘතියේ බලාධිකාරියත් පැහැදිලි ය. සංකේත පරිභෝජනය කරමින් සිටින නූතන මිනිසා පරිභෝජනවාදයේ බිල්ලක් වූ ආකාරය මේ අනුව හඳුනාගත හැකි ය. සමාජ මාධ්‍ය විශේෂ කොටගත් මාධ්‍ය තුළ පවත්නා ව්‍යාප්තිය හා අධිකාරීත්වය ඔස්සේ තරුණ ප්‍රජාව ඇතුළු මුලුමහත් සිවිල් සමාජය ම එම ජන සංස්කෘතිය මගින් පාලනය කරමින් සිටින අතර මෙම නව ප්‍රවණතාව සිවිල් සමාජය දැඩි අවදානම් සමාජයකට රැගෙන යමින් සිටින බව හඳුනාගත හැකි ය. මේ අනුව සමකාලීන ලාංකේය සිවිල් සමාජය අද කොයිබටද යන්න විවේචනාත්මකව සාකච්ඡා කළ යුතු කාලය එළඹ ඇති බව හඳුනාගත හැකි ය. ජන සංස්කෘතියේ අංග නොනසා එය ද ආරක්ෂා කර ගනිමින් සිවිල් සමාජය සුරක්ෂිත කරගැනීමේ කාර්යය ලාංකීයයන් වශයෙන් සිතිය

යුතු කාලය එළඹ ඇති බව මෙහි දී සංක්ෂිප්තව විමර්ශනය කර ඇත. ඒ අනුව ජන සංස්කෘතියේ නම්‍යශීලිභාවය රැක ගනිමින් සිවිල් සමාජය පවත්වා ගැනීම පිළිබඳ කතිකාවක් තීව්‍ර කර ගැනීම හෙට දිනයේ වඩා වැදගත් වනු ඇත.

## පරිශීලන නාමාවලිය


අයිවන්, වි. (2006). *ශ්‍රී ලංකාවේ නූතන කැරලිකරුවන්ගේ සමාජ පසුබිම*, මරදාන: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

උස්වත්ත ආරච්චි, ජී. (2007). සමාජය, *ආර්ථිකය හා අධ්‍යාපනය*. පන්නිපිටිය: ස්ටැම්ෆර්ඩ් ලේක් ප්‍රකාශන.

පින්නවල, එස්. (2004). *ශ්‍රී ලාංකේය සමාජයේ ලිබරල් ප්‍රජාතන්ත්‍රික ඇගැයුම් ආකල්ප සහ ආයතනවල බිඳ වැටීම්.* ඉදුවර 2 වරකාපොල: ආරිය ප්‍රකාශකයෝ.

පෙරේරා, එස්. (2003). "*මෝල් සාප්පු සංකීර්ණ: පරිභෝජනවාදයේ දේවස්ථානයේ ද? අධි යථාර්ථවාදයේ සංකේත ද?*" පඨිත, 54-81.

Appelrouth, S. & Edles, L. D. (2011). *Sociological Theory in the Contemporary Era*. London: SAGE Publications.

Bauman, Z & Bordoni, C. (2014). *State of Crisis*. Cambridge: Polity

Beck, U. (1992). *The Risk Society*, London: Routledge.

Buadrillard, J. (1993).*Symbolic Exchange and Death*. London: SAGE.

Doshi, S.H. (2006). *Moderatity, Postmoderatity and Neo-Socialogical Theories*, Jaipur : Rawat.

Giddens, A. (1997). *Sociology*. London: Blackwell Publications.

Habermas, J. (2002). *The Theory of Communicative Actions*. Boston: Beacon Press.

Jayawardena, V.K. (2003). *Nobodies to somebodies*: The rise of a colonial bourgeois in Sri Lanka, Colombo: Social Scientist Association.

Miles, S. (2001). *Sociological Theory in the real world*. New Delhi: SAGE Publications.

Ritzer, G. (1996). *Sociological Theories*. Meryland, Mc.Grawhill Education.

Roberts, M. (1973). *Elite formation and elities* 1832-1931. In De Silva K.M.ed. History of Ceylon vol. 3. Peradeniya: University of Ceylon. pp. 263-284.

Swingeiwood, A. (1998). *Cultural Theory and Problem of Modernity*. New York: St. Martines Press.